# මාසික

# විවරණිකාව

2010 සැප්තැම්බර්



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

60 වැනි වෙළුම 09 වැනි කලාපය

## 2010 සැප්තැම්බර්

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයඃ ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2010 සැප්තැම්බර් | ..... | 07 |
| 1. 2010 ජූනි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය | ..... | 07 |
| 2. උද්ධමනය 2010 අගෝස්තු මාසයේ දී ඉහළ යයි | ..... | 10 |
| 3. බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතා පුළුල් කිරීම | ..... | 11 |
| 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 සැප්තැම්බර් | ..... | 11 |
| 5. බැංකු විසින් ණය මුදල් සඳහා වන පොලී අනුපාතික අඩු කිරීම | ..... | 12 |
| 6. මැදි කාලීන ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ උපායමාර්ග ධනාත්මක ප්‍රතිඵල අත්කර දේ | ..... | 13 |
| 7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සම්පස්ථ ණය පහසුකම යටතේ පස්වන ණය වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 212.5 ක් නිකුත් කෙරේ | ..... | 14 |
| 8. එක්සත් ජනපද ඩොලර් බිලියන 1 ක වටිනාකමින් යුතු ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සඳහා පැය 14 ක් තුළ දී ගෝලීය ආයෝජකයින්ගේ ඉල්ලුම එක්සත් ජනපද ඩොලර් බිලියන 6 ඉක්මවයි | ..... | 14 |
| 9. ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ප්‍රතිප්‍රාග්ධනගත කිරීම | ..... | 15 |
| 10. උද්ධමනය 2010 සැප්තැම්බර් මාසයේ දී ඉහළ යයි | ..... | 17 |
| 11. ණය පහසුකම් සඳහා වන සාමාන්‍ය වෙන් කිරීම් අවශ්‍යතාව පහත හෙළීම | ..... | 18 |
| 12. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය ස්ථාපිත කිරීම | ..... | 18 |
| 13. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) 2008, 2009 සහ 2010 | ..... | 19 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2010 සැප්තැම්බර්

### රාජ්‍ය මූල්‍ය අංශය

- අර්තාපල් ආනයනය කිරීමේ දී අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුන සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී.
- සීනි ආනයනය කිරීමේ දී අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවත් මාස 3 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.
- එල්.පී. ගෑස් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 13.12 ක නිෂ්පාදන බද්දක් නැවත පනවන ලදී.

### ජර්මානු රජයෙන් ලැබුණු ණය

ගාලු දිස්ත්‍රික්ක ජල සැපයුම් පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - දෙවන අදියර මූල්‍යනය කිරීම සඳහා 2010 අගෝස්තු 30 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජර්මානු රජය අතර යුරෝ මිලියන 1.26 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 180.72 ක) ණය ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.75 ක පොලී අනුපාතිකයක් සහ ණය මුදලින් ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.25 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. අවුරුදු 10 ක සහන කාලයකට යටත්ව අවුරුදු 60 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයෙන් ලද ප්‍රදාන

ශ්‍රී ලංකාවේ අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 සැප්තැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය අතර රුපියල් මිලියන 60.03 ක ප්‍රදානයකට අත්සන් තබන ලදී.

### එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලද ප්‍රදාන

උතුරු පළාතේ ආහාර ආරක්ෂණය හා ජීවනෝපාය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ පළමු අදියර මූල්‍යනය කිරීම සඳහා 2010 සැප්තැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය අතර, එ.ජ.ඩොලර් මිලියන 1.48 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 167.05 ක) ප්‍රදානයක් සඳහා වූ ගිවිසුමකට අත්සන් තබන ලදී.

### ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයෙන් ලද ප්‍රදාන

උතුරු පළාත ප්‍රතිසංස්කරණය කිරීමේ කඩිනම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 අගෝස්තු 13 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය අතර එ.ජ.ඩොලර් මිලියන 10.54 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.18 ක) ප්‍රදානයක් සඳහා වූ ගිවිසුමකට අත්සන් තබන ලදී.

### චීන අපනයන-ආනයන බැංකුවෙන් ලද ණය

2010 සැප්තැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන-ආනයන බැංකුව අතර අත්සන් කරන ලද ගිවිසුම් පහත පරිදි වේ.

1. යාපනය පේදුරුතුඩුව මාර්ගය (AB020) පුත්තර්-මීසාලේ මාර්ගය (AB032), යාපනය-කන්කසන්තුරේ මාර්ගය (AB016) සහ යාපනය-පලාලි මාර්ගය (AB018) යන මාර්ගයන්හි කි.මී.84 ක දුර ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 75.4 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 8.5 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

2. කි.මී. 63 ක දිගින් යුත් නුවර-යාපනය මාර්ගය (A009) (ගල්කුලම සිට කි.මී. 230 කණුව දක්වා) ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 71.02 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 8.01 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

3. කි.මී.90 ක දිගින් යුත් නුවර-යාපනය මාර්ගය (A009) (කි.මී.230 කණුව සිට යාපනය දක්වා) ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 70.58 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 7.96 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

4. උතුරු පළාත් මාර්ග ප්‍රතිසංස්කරණ (11A) ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 42.78 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 4.82 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම.

5. උතුරු පළාත් මාර්ග ප්‍රතිසංස්කරණ (11B) ව්‍යාපෘතිය මූ්‍යලනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 42.51 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 4.79 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම.

ඉහත සඳහන් ණය සඳහා මාස 6 ක ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත වාර්ෂිකව සියයට 2.4 ක ආන්තිකයක් සමග වූ පොලී අනුපාතිකයක් ද, ණය පහසුකම මත සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් සහ ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.7 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 3 ක සහන කාලයකට යටත්ව වසර 15 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

6. MA 60 ගුවන් යානා දෙකක් මිල දී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මූල්‍යනය කිරීම සඳහා චීන යුආන් මිලියන 280 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 4.65 ක) ණය මුදල සඳහා වූ ගිවිසුමට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 2 ක පොලී අනුපාතිකයක් ද, ණය පහසුකම මත සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් සහ වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

7. උතුරු පළාතේ බලශක්ති අංශය සංවර්ධන වැඩපිළිවෙළ සඳහා උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 31.66 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 3.57 ක) ණය මුදල සඳහා වූ ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා මාස 6 ක ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත වාර්ෂිකව සියයට 2.8 ක පොලී අනුපාතිකයක් ද, සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් සහ ප්‍රයෝජනයට නොගත් ශේෂය මත වාර්ෂිකව සියයට 0.7 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 2 ක සහන කාලයකට යටත්ව වසර 12 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.


## 2 වන කොටස

# පුවත්පත් නිවේදන


## 2010 සැප්තැම්බර්

### 1. 2010 ජුනි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 ජුනි මාසයේ දී අපනයන ආදායම සහ ආනයන වියදම සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. 2010 ජුනි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 697 දක්වා සියයට 23 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූයේ කාර්මික සහ කෘෂිකාර්මික අංශවලින් ලද ඉහළ ආදායමයි. සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්ගේ වර්ධනයන් පිළිඹිබු කරමින්, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,114 දක්වා සියයට 32 කින් වර්ධනය විය. 2010 පළමු මාස හය තුළ දී සමුච්චිත අපනයන ආදායම සහ ආනයන වියදම පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 42 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම කාලපරිච්ඡේදය තුළදී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් මිලියන 2,844 දක්වා පුළුල් විය.*




මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව




මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

2010 ජුනි මාසයේ අපනයන වර්ධනයට ප්‍රධාන වශයෙන්ම දායක වූයේ ඇඟළුම් සහ රබර් නිෂ්පාදන අපනයනයන්ගේ දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනයයි. රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම එ.ජ.ඩො.මිලියන 305 ක් දක්වා සියයට 24 කින් වර්ධනය වූ අතර එයට මූලික වශයෙන් දායක වූයේ, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වෙත කරන ලද ඇඟළුම් අපනයන පිළිවෙලින් සියයට 34 කින් සහ සියයට 8 කින් වැඩිවීමයි. රබර් නිෂ්පාදන අපනයන එ.ජ.ඩොලර් මිලියන 52 දක්වා සියයට 110 කින් ඉහළ ගිය අතර, නැවත පිරවූ ටයර් මෙන්ම අත්වැසුම් වැනි අනෙකුත් රබර් නිෂ්පාදන මේ සඳහා දායක විය. ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ආදායම ද සියයට 62 කින් වර්ධනය විය. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 ජුනි මාසයේ දී කෘෂිකාර්මික අපනයන මුළු අපනයනයන්ගෙන් සියයට 24 කට දායකත්වය ලබා දෙමින් වර්ධනය වූ අතර, තේ අපනයන අංශය වඩා ප්‍රබල ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කළේය. 2010 ජුනි මාසයේදී තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 4.32 ක් වූ අතර, එය පෙර වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදය සමග සසඳන විට සියයට 11 ක වර්ධනයක් පිළිබිඹු කරයි. කරදමුංගු සහ සුගන්ධ තෙල්වලට ලැබුණු මිල ගණන් ඉහළයාම සහ තල ඇට, කොකෝවා,

කරාබු නැටි සහ ගම්මිරිස් අපනයන පරිමාවන් ද සැලකිය යුතු අන්දමින් ඉහළ යාම හේතුවෙන් සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදායම සියයට 62 කින් වර්ධනය විය. එකතු කළ අගය ඉහළ නැංවීම තුළින් වඩා වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි බව පිළිඹිබු කරමින්, අපනයන වෙළෙඳපොළට රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරන දේශීය කර්මාන්තවලින් රබර් සඳහා ලැබුණු ඉහළ ඉල්ලුම සහ සැපයුමේ හිඟතාවය මූලික කොට ගෙන, රබර් අපනයන ප්‍රමාණය පහත වැටුණි.

2010 ජූනි මාසයේ දී ආනයන වියදම ශීඝ්‍රයෙන් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ යාමයි. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 77.26 දක්වා සියයට 6 කින් ඉහළ ගියේය. 2009 වසර හා සැසඳීමේ දී, 2010 ජූනි මාසයේ දී පොහොර ආනයන වියදම ඉහළ ගිය අතර, ආනයන පරිමාව සැලකිය යුතු අන්දමින් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2010 ජූනි මස 01 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි, මෝටර් වාහන සහ විදුලි උපකරණවල බදු අඩු කිරීම හේතුවෙන්, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයේ සැළකිය යුතු වර්ධනක් දක්නට ලැබුනු අතර, මේ හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද ඉහළ යන ලදී. 2010 ජූනි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන ද සියයට 30 කින් ඉහළ ගිය අතර, මේ සඳහා මූලික වශයෙන්ම හේතු වුයේ බස්, වෑන්, ලොරි සහ ත්‍රී රෝද රථ වැනි ප්‍රවාහන උපකරණ ආනයන සියයට 257 කින් ඉහළයාමයි. මෙම මාසය තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන ද සියයට 38 කින් ඉහළ ගියේය.

2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 වසරේ පළමු භාගය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 1,820 දක්වා සියයට 13.5 කින් වර්ධනය විය. 2010 ජූනි මස අවසන් වනවිට දේශීය වශයෙන් ඇතිකරගත් විනිමය හුවමාරු ගිවිසුම්වල (SWAP) වටිනාකම ඇතුළුව ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් මිලියන 6,013 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 5,731 ක් දක්වා වර්ධනය විය. පසුගිය මාස 12 තුළ පැවැති සාමාන්‍ය මාසික ආනයන වියදම වන එ.ජ.ඩොලර් මිලියන 1,001 ට අනුව බලනවිට, ආසියානු නිෂ්කාශණ සංගමයේ අරමුදල් රහිත, නමුත් දේශීය වශයෙන් ඇතිකරගත් විනිමය හුවමාරු ගිවිසුම්වල වටිනාකම් ද ඇතුළත්ව දළ නිල සංචිත ප්‍රමාණය මාස 5.7 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

මෙම කාලපරිච්ඡේදය තුළ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.


## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය - 2010 ජූනි සහ 2010 ජනවාරි - ජූනි

| | 2009 ජූනි එ.ජ.ඩො. මිලියන | 2010 ජූනි එ.ජ.ඩො. මිලියන | ජූනි වර්ධනය (සියයට) | 2009 ජන: සිට ජූනි එ.ජ.ඩො. මිලියන | 2010 ජන: සිට ජූනි එ.ජ.ඩො. මිලියන | ජන: සිට ජූනි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **565.21** | **697.48** | **23.40** | **3,188.66** | **3,624.20** | **13.66** |
| කෘෂිකාර්මික | 136.72 | 167.96 | 22.85 | 728.27 | 922.65 | 26.69 |
| මෙයින් තේ | 104.53 | 120.63 | 15.40 | 505.12 | 625.71 | 23.87 |
| කාර්මික | 419.68 | 523.49 | 24.73 | 2,422.40 | 2,655.77 | 9.63 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 246.29 | 304.99 | 23.84 | 1,536.91 | 1,498.70 | -2.49 |
| ඛනිජ ද්‍රව්‍ය | 8.81 | 6.03 | -31.51 | 37.99 | 45.78 | 20.52 |
| **ආනයන** | **845.10** | **1,113.61** | **31.77** | **4,551.59** | **6,467.76** | **42.10** |
| පාරිභෝගික භාණ්ඩ | 153.59 | 211.38 | 37.63 | 932.95 | 1,338.47 | 43.47 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 102.60 | 121.47 | 18.39 | 598.89 | 887.50 | 48.19 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 50.99 | 89.91 | 76.33 | 334.06 | 450.97 | 35.00 |
| අන්තර් භාණ්ඩ | 508.48 | 665.55 | 30.89 | 2,395.12 | 3,682.42 | 53.75 |
| මෙයින්: ඛනිජ තෙල් | 233.55 | 285.58 | 22.28 | 869.16 | 1,715.02 | 97.32 |
| රෙදිපිළි හා ඇඟළුම් | 104.14 | 139.15 | 33.62 | 654.88 | 741.11 | 13.17 |
| ආයෝජන භාණ්ඩ | 175.42 | 227.26 | 29.55 | 1,162.95 | 1,316.67 | 13.22 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 74.02 | 78.09 | 5.50 | 515.90 | 519.03 | 0.61 |
| ප්‍රවාහන උපකරණ | 16.02 | 57.19 | 256.88 | 159.95 | 267.96 | 67.52 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 50.27 | 69.43 | 38.12 | 342.48 | 388.81 | 13.53 |
| **වෙළෙඳ ශේෂය** | **-279.89** | **-416.13** | **48.68** | **-1,362.93** | **-2,843.56** | **108.64** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **280.49** | **321.79** | **14.73** | **1,602.91** | **1,820.01** | **13.54** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

## 2. උද්ධමනය 2010 අගෝස්තු මාසයේ දී ඉහළ යයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද) (2002 =100) ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන උද්ධමනය, අපේක්ෂා කළ පරිදි 2010 ජූලි මස පැවති සියයට 4.3 හි සිට 2010 අගෝස්තු මාසයේ දී සියයට 5.0 දක්වා ඉහළ ගියේය.*




2009 අගෝස්තු මාසයේ පැවැති පහළ පදනම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. උද්ධමනය අනුයාත මාස 5 ක් තුළ පහළ බැසීමෙන් අනතුරුව මෙම ඉහළ නැගීම සිදුවිය. මේ අතර, පසුගිය මාස 12 ක කාල පරිච්ඡේදය තුළ සිදු වූ මිල විචලනයන්හි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, පූර්ව මාසයේ පැවති සියයට 4.2 හි සිට 2010 අගෝස්තු මාසයේ දී සියයට 4.5 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර හා බලශක්ති නොවන අයිතමයන්ගේ මිල විචලනය මගින් මනිනු ලබන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 5.9 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 5.5 දක්වා පහත වැටුණු අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය අනුයාත තුන්වන මාසයටත් සියයට 6.3 හි ස්ථාවරව පැවතිණි.

දර්ශකයෙහි 0.5 ක් වූ මාසික ඉහළ යෑම සඳහා රෙදිපිළි හා පාවහන් (සියයට 1.2); ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 0.8); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.3); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.2); සෞඛ්‍යය (සියයට 0.2); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු කටයුතු (සියයට 0.1); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.2); යන උප කාණ්ඩවල මිල ඉහළ යෑම් දායක විය. බොහොමයක් එළවළු වර්ග, සහල්, අර්තාපල් හා රතු ළූණු ආදියෙහි ඍතුමය මිල පහළ යෑම් සහ ගෑස් මිල ගණන් පහළ දැමීමෙන් දර්ශකය මත ඇති වූ හිතකර බලපෑම, සමහර මත්ස්‍ය වර්ග හා මුහුදු ආහාර, මස්, කිරිපිටි, පාන්, තිරිඟු පිටි, පිටතින් මිල දී ගන්නා ආහාර, පළතුරු සහ නිමි ඇඳුම්වල මිල ඉහළ යෑම මගින් යටපත් විය. මේ අතර, ප්‍රවාහන, සන්නිවේදන සහ අධ්‍යාපන යන උප කාණ්ඩ මෙම මාසය තුළ දී නොවෙනස්ව පැවතිණි.

## 3. බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතා පුළුල් කිරීම

*අභ්‍යන්තර හා බාහිර පීඩනයන්ට මනාව මුහුණ දිය හැකි ශක්තිමත් බැංකු පද්ධතියක පැවැත්ම තහවුරු කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් පහත දැක්වෙන පරිදි ඉහළ නැංවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත.*

**නව බැංකු**

| වර්ෂය | බලපත්‍රලාභී වාණිජ බැංකු (රුපියල් බිලියන) | බලපත්‍රලාභී වාණිජ බැංකු (රුපියල් බිලියන) |
|---|---|---|
| 2010 | 3.0 | 2.0 |
| 2012 | 4.0 | 2.5 |
| 2014 | 5.0 | 3.0 |

**දැනට පවතින බැංකු**

| ක්‍රියාත්මක වන දිනය | බලපත්‍රලාභී වාණිජ බැංකු (රුපියල් බිලියන) | බලපත්‍රලාභී වාණිජ බැංකු (රුපියල් බිලියන) |
|---|---|---|
| 31.12.2011 | 3.0 | 2.0 |
| 31.12.2013 | 4.0 | 2.5 |
| 31.12.2015 | 5.0 | 3.0 |

ආර්ථිකය තුළ අලුතින් සංවර්ධනය වන අංශ කෙරෙහි වන බැංකුවල දායකත්වය පුළුල් කිරීමත් ඇති විය හැකි අනපේක්ෂිත අලාභයන් දරා ගැනීමත් සඳහා පහසුකම් සැලසීම ද ඉහළ නැංවෙන ප්‍රාග්ධනය මගින් සිදු කෙරෙනු ඇත.

මෙම අවශ්‍යතාවය පවත්වා ගැනීමට සමගාමීව, වඩාත් පාරදෘශ්‍යභාවයකින් යුතුව අතිරේක ප්‍රාග්ධනය රැස්කර ගැනීම සහ වෙළෙඳපොළ සංයමය තුළින් ආයතනික යහපාලනය තවදුරටත් වර්ධනය කර ගැනීම උදෙසා බැංකුවල ඇති හැකියාව වැඩි කිරීමේ අවශ්‍යතාවය ද සළකා බලමින්, මෙරට සංස්ථාපිත මෙතෙක් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත නොවූ පෞද්ගලික බැංකුවලට, 2011.12.31 දින වන විට කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වන ලෙස නියම කිරීමට ද මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇත.

## 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 සැප්තැම්බර්

*පසුගිය මාසවල දී මහ බැංකුව විසින් ගන්නා ලද මුදල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර ලෙස වෙළෙඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව පහත බසිමින් පවතී. පවත්නා අඩු උද්ධමනය සහ ඉදිරි උද්ධමනය පිළිබඳ හිතකර අපේක්ෂාවන් පිළිබිඹු කරමින් පොලී අනුපාතික පිළිබඳව මිණුම් දණ්ඩක් ලෙස සැළකෙන ද්විතීය වෙළෙඳපොළේ ගනුදෙනු වන රජයේ සුරැකුම්පත් සඳහා වන ඵලදා වක්‍රය මෑත මාස තුළ දී පහතට නැඹුරු වී ඇති අතරම වඩාත් පැතළි ස්වරූපයක් ගෙන ඇත. වෙළෙඳපොළ අනෙකුත් පොලී අනුපාතික ද පහත බැස ඇත. කෙසේ වුවද, මූල්‍ය ආයතනවල ණය පොලී අනුපාතිකයන් සංශෝධනය වීම ඔවුන්ගේ අරමුදල් සඳහා වන පිරිවැයෙහි සිදුවන සංශෝධනවලට පසුව සිදුවන බව දක්නට ලැබේ. එමනිසා මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි වෙනස් වීම පූර්ණ ලෙස පිළිබිඹු කරමින් වෙළෙඳපොළ ණය පොලී අනුපාතික ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී තවදුරටත් පහත බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

මේ අතර, පෞද්ගලික අංශය වෙත ලබාදෙනු ලබන ණය ප්‍රමාණය ඉහළ යමින් පවතී. 2010 ජූලි වන විට වාණිජ බැංකු වෙතින් පෞද්ගලික අංශය ලබාගත් ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.9 ක වර්ධනයක් වාර්තා කරන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු මෙන්ම ලියාපදිංචි මූල්‍ය සමාගම් විසින් සාමූහිකව සපයන ලද මුළු ණය ප්‍රමාණය ද 2010 ජූලි මාසයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.9 ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2010 පළමු භාගය තුළ සියයට 7.8 ක වර්ධනයක් වාර්තා කිරීමෙන් අනතුරුව 2010 වසර තුළදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 7.5 - 8.0 අතර ප්‍රශංසනීය වර්ධන වේගයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කරන

අතර, මෙයට අනුරූපව පෞද්ගලික අංශය විසින් ලබා ගන්නා ණය ප්‍රවාහයන් තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත දක්වා ඇති කරුණු සැළකිල්ලට ගනිමින් 2010 සැප්තැම්බර් 21 දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලය විසින් මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවෙහි ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 7.25 හා සියයට 9.00 ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය, 2010 ඔක්තෝබර් මස 21 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

## 5. බැංකු විසින් ණය මුදල් සඳහා වන පොලී අනුපාතික අඩු කිරීම

*2009 වසරේ පෙබරවාරි මස සිට සිය ප්‍රතිපත්ති පොලී අනුපාතයන් වන ප්‍රති මිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් අනුපාත පිළිවෙළින් පදනම් අංක 325 කින් සහ 300 කින් පහත හෙළමින්, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය ළිහිල් කර ඇත. එයට ප්‍රතිචාර වශයෙන් වෙළෙඳපොළ පොලී අනුපාතයන් ද පහළ ගොස් ඇත.*

බැංකුවල ණය මුදල් සඳහා වන පොලී අනුපාතික ද කාල ප්‍රමාදයක් සහිතව වුවද පහත වැටී ඇති මුත්, පහත යාමේ සම්පූර්ණ ගැලපීම සිදු වීමට නම් පොලී අනුපාත තවදුරටත් පහත යා යුතුය. එමෙන්ම වර්තමාන සාර්ව ආර්ථික කාර්ය සාධනය සහ ස්ථායීතාවය අනුව ණය පොලී අනුපාතයන්ට ඇතුළත්ව ඇති අවදානම වෙනුවෙන් වන අධිභාරය අඩු කළ හැකි අතර, එමගින් ණය දීමේ අනුපාත සහ තැන්පතු අනුපාත අතර වන පොලී පරතරය තවදුරටත් පහත දැමිය හැකිය.

ඉහත කරුණු පදනම් කර ගෙන 2010 වසරේ ඔක්තෝබර් මස අවසාන වන විට අවම වශයෙන් පහත සඳහන් පරිදි පොලී අනුපාතයන් පහත හෙළීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව සියලුම බැංකුවලින් ඉල්ලා ඇත.

- නිවාස ණය සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 14 දක්වා පහත හෙළීම.
- ණයපත් අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 24 දක්වා පහත හෙළීම.

  වෙනත් ණය සහ අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 1 - 2 අතර අගයකින් තවදුරටත් පහත හෙළීම.

## 6. මැදි කාලීන ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ උපායමාර්ග ධනාත්මක ප්‍රතිඵල අත්කර දේ

*ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වන ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් (S&P) සහ ෆිච් රේටින්ග්ස් යන ආයතන විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවන ලදී. තෙවන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය වන මූඩීස් ආයෝජක සේවා ආයතනය විසින් ද ශ්‍රී ලංකාව පිළිබඳ සාපේක්ෂ ණය ශ්‍රේණිගත කිරීමක් ඉදිරිපත් කර ඇති අතර, මෙම ණය ශ්‍රේණිගත කිරීම් පහත පරිදි වේ.*

- ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතන විසින් 2010 සැප්තැම්බර් 14 වන දින ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය ශ්‍රේණිගත කිරීම B+ දක්වා සහ දීර්ඝකාලීන දේශීය ව්‍යවහාර මුදල් ණය ශ්‍රේණිගත කිරීම BB- දක්වා ඉහළ නංවන ලද අතර, ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ දැක්ම "ස්ථාවර" ලෙස තහවුරු කරන ලදී.

- ෆිච් රේටින්ග්ස් ආයතනය විසින් 2010 සැප්තැම්බර් 21 වැනි දින ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීන දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදල් ණය පැහැරහැරීමේ අවදානම සම්බන්ධයෙන් වන ශ්‍රේණිගත කිරීම B+ මට්ටමේ සහතික කරන ලද අතර, ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම "ධනාත්මක" මට්ටම දක්වා ඉහළ නංවන ලදී.

- මූඩීස් ආයෝජක සේවා ආයතනය 2010 සැප්තැම්බර් 22 වැනි දින විදේශ ව්‍යවහාර මුදල් ණය නිකුත් කිරීම පිළිබඳ ශ්‍රේණිගත කිරීම සඳහා B1 මට්ටම ලබා දෙමින් ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම "ස්ථාවර" ලෙස ප්‍රකාශයට පත්කරන ලදී.

ඒ අනුව, රටේ වර්තමාන ණය ශ්‍රේණිගත කිරීම් පහත පරිදි වේ.

| ශ්‍රේණිගත කිරීමේ ආයතනය | ශ්‍රේණිගත කිරීම | දැක්ම |
|---|---|---|
| ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් | B+ | ස්ථාවර |
| ෆිච් | B+ | ධනාත්මක |
| මූඩීස් | B1 | ස්ථාවර |

අභ්‍යන්තර ගැටුම් අවසන්වීමෙන් පසු රටෙහි ඇති වූ ධනාත්මක වර්ධනයන් හේතුකොට ගෙන මෙම ඉහළ ශ්‍රේණිගත කිරීම් අපේක්ෂා කර තිබුණි. සාර්ව ආර්ථික මූලිකාංගයන්හි ඇති වූ දියුණුව, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, ආර්ථිකයේ සැලසුම් කර ඇති ව්‍යුහාත්මක වර්ධනයන් සහ ඉහළ ආර්ථික වර්ධන අපේක්ෂා, ඉදිරි හා මධ්‍යකාලීනව ශ්‍රී ලංකාවට ඉහළ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ලබාගැනීමට තවදුරටත් උපකාරී වනු ඇත.

මෙම ශ්‍රේණිගත කිරීම් උසස් කිරීම, මධ්‍යකාලීනව ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම කෙරෙහි යොමු වූ උපාය මාර්ගයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. මෙම අරමුණ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහළ මට්ටමේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ කමිටුවක් පත්කරන ලද අතර, එය මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ඇතැම් පෞද්ගලික අංශයේ ප්‍රධානීන්ගෙන් සමන්විත වේ. රටේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම අරමුණු කර ගෙන ආර්ථිකයේ සිදුවන වර්ධනයන් පිළිබඳව නිතර විමර්ශනය කිරීම සහ ශ්‍රේණිගත කිරීමේ උපදේශකවරුන් හරහා ශ්‍රේණිගත කිරීමේ ආයතන සමග සාකච්ඡා කිරීම මෙම කමිටුවට පැවරී ඇත.

## 7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සම්පස්ථ ණය පහසුකම යටතේ පස්වන ණය වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 212.5 ක් නිකුත් කෙරේ

*ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) විසින් සම්පස්ථ ණය පහසුකමට අදාල සිව්වන විමර්ශනය සාර්ථකව නිමකරමින් 2010 සැප්තැම්බර් 24 වැනි දින වි.ගැ.හි. මිලියන 137.8 (දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 212.5) ක වටිනාකමින් යුත් පස්වන වාරිකය මුදාහරින ලදී.*

මෙම මුදාහැරීමත් සමග 2009 ජූලි මාසයේ දී අනුමත වූ සම්පස්ථ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාවට මේ වන විට ලැබී ඇති මුළු ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,275 කි. මෙම ණය මුදාහැරීම් මෙන්ම, විදේශ වෙළෙඳාම වර්ධනය වීමෙන් ලද ලැබීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම, විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය වෙත ගලා ආ මූල්‍ය ප්‍රවාහ සහ පෞද්ගලික අංශය ලද ලැබීම්, රටේ සංචිත ප්‍රමාණය වඩාත් සතුටුදායක මට්ටමක් දක්වා ඉහළ නැංවීම සඳහා ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේ දී දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිතව) මෙතෙක් එහි ඉහළතම අගය වන එ.ජ.ඩොලර් බිලියන 6.1 ක මට්ටමේ පවතින අතර, එය මාස 5.8 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වේ.

මේ හා සම්බන්ධ අභිප්‍රාය පළකිරීමේ ලිපිය (LOI) සහ තාක්ෂණික අවබෝධතා ගිවිසුම (TMU) ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ (www.cbsl.gov.lk) පළකර ඇත.

## 8. එක්සත් ජනපද ඩොලර් බිලියන 1 ක වටිනාකමින් යුතු ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සඳහා පැය 14 ක් තුළ දී ගෝලීය ආයෝජකයින්ගේ ඉල්ලුම එක්සත් ජනපද ඩොලර් බිලියන 6 ඉක්මවයි

*එක්සත් ජනපද ඩොලර් බිලියන 1 ක වටිනාකමින් යුතු සියයට 6.25 ක කූපන් අනුපාතිකයක් සහිත වසර 10 ක ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවක් 2010 සැප්තැම්බර් 27 වන දින ශ්‍රී ලංකාව විසින් අවසන් කරන ලදී. මෙය 2007 සහ 2009 දී නිකුත් කළ ස්වෛරීත්ව බැඳුම්කර වලට පසුව කරන ලද තෙවැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවයි.*

මෙම නිකුතුව, 2010 සැප්තැම්බර් 27 වන දින ආරම්භ කර පැය 14 ක් ඇතුළත එක්සත් ජනපද ඩොලර් බිලියන 6.3 ඉක්ම වූ ඇණවුම් ප්‍රමාණයක් එනම් 6 ගුණයකට අධික අධිදායකත්වයක් ආකර්ෂණය කර ගන්නා ලදී. මෙයින් සනිටුහන්වන්නේ රටෙහි අභ්‍යන්තර ගැටුම් අවසන්වීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑත කාලීන ප්‍රගතිය හා අනාගත ආර්ථික වර්ධනය පිළිබඳ අපේක්ෂාවන් මත පදනම් වූ ගෝලීය ආයෝජකයින්ගේ ඉහළ විශ්වසනීයත්වයයි.

ගෝලීය වශයෙන්, ආයෝජකයින් 362 ගෙන් ඇණවුම් ලැබී තිබිණ. භුගෝලීය ව්‍යාප්තියෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ, එම බැඳුම්කර ප්‍රමාණයෙන් සියයට 52.5 ක් එක්සත් ජනපදයේ ආයෝජකයන්ට ද, සියයට 25 ක් යුරෝපීය ආයෝජකයන්ට සහ සියයට 22.5 ක් ආසියාවෙහි ආයෝජකයන්ට ද බෙදී ගොස් ඇත. ආයෝජකයින් වර්ග අනුව ගත්කළ, බැඳුම්කරවලින් සියයට 85 ක් අරමුදල් සහ වත්කම් කළමනාකරුවන්ගෙන් ද ඉතිරිය විශ්‍රාම අරමුදල්, රක්ෂණ සමාගම් සහ බැංකුවලින් ද සමන්විත වී ඇත.

මෙම නිකුතුව, 144 ඒ/එස් රෙගුලාසියට අනුකූල වන අතර බැඳුම්කර 2020 ඔක්තෝබර් මස දී කල් පිරේ. මෙම බැඳුම්කර ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ්

පුවර්ස් සහ ෆිච් රේටින්ග්ස් යන අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ ආයතන දෙක විසින් B+ කාණ්ඩයට ශ්‍රේණිගත කර ඇති අතර සිංගප්පූරු විනිමය වෙළෙඳපොළේ ලැයිස්තුගත කරනු ඇත.

2007 සහ 2009 දී සිදුකළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු සමග සැසඳීමේ දී වසර 10 ක ස්වෛරීත්ව බැඳුම්කරය සඳහා තීරණය වූ සියයට 6.25 ක් වූ කූපන් අනුපාතිකය සැළකිය යුතු ලෙස පහළ මට්ටමක පවතී.

රජය විසින් මෙම බැඳුම්කර නිකුතුවෙන් ලැබෙන අරමුදල්, දැනට ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනය කිරීමට සහ සමස්ත රාජ්‍ය ණය කළමනාකරණය විධිමත් කිරීම සඳහා රජයේ දැනට පවතින ණය තොගයෙන් කොටසක් ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස යොදා ගනු ඇත.

| වසර | ප්‍රමාණය එ.ජ.ඩො.මිලියන | පරිණතිය (වසර) | කූපන් අනුපාතිකය (%) |
|---|---|---|---|
| 2007 | 500 | 5.0 | 8.25 |
| 2009 | 500 | 5.25 | 7.40 |
| 2010 | 1000 | 10.0 | 6.25 |

බැන්ක් ඔෆ් ඇමරිකා මෙරිල් ලින්ච්, රෝයල් බැන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ් සහ එච්.එස්.බී.සී. බැංකුව මෙම නිකුතුව සම්බන්ධයෙන් ඒකාබද්ධ නියමු කළමනාකරුවන් සහ ඒකාබද්ධ ගනුදෙනු පවත්වාගන්නන් ලෙස කටයුතු කළ අතර ලංකා බැංකුව සම කළමනාකරු ලෙස සහභාගි විය.

## 9. ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ප්‍රතිප්‍රාග්ධනගත කිරීම

*සෙලින්කෝ ව්‍යාපාර සමූහයට අයත් සමහර ආයතනයන්හි බිඳ වැටීම හේතු කොට, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි ඇති වූ අපහසුකාරී තත්ත්වයන් පාලනය කර එම ආයතනය ස්ථාවර කිරීමේ අටියෙන්, 2009 පෙබරවාරි මාසයේ දී එහි මෙහෙයුම් කටයුතු සඳහා මැදිහත්වීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලදී. ඒ අනුව, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී සඳහා කළමනාකරන නියෝජිතයකු පත්කිරීම හා අනෙකුත් අදාළ වූ විශේෂිත විධානයන් නිකුත් කිරීම සිදු කෙරිණි. ඉහත පියවරයන් මෙම මූල්‍ය ආයතනය ස්ථාවරව පවත්වා ගැනීමට හා ආයතනය සමග බැඳුණු සේවක, ගනුදෙනුකාර, තැන්පත්කාර සහ කොටස්කාර ආදී සියලුම පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගනිමින් රටේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වා ගැනීමට දායක විය. එම මැදිහත්වීම්හි ප්‍රතිඵලයක් ලෙස මේ වනවිට මහජනතාවගේ විශ්වාසය නැවත දිනා ගනිමින් මෙම සමාගම පෙර දී ඇති වූ කම්පනකාරී තතත්වයන්ගෙන් අත්මිදී කිසියම් ස්ථාවර තත්ත්වයකට පත්ව සිටින්නේය.*

මෙවන් පසුබිමක් තුළ සමාගමේ මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම තහවුරු කරනු වස් මෙම සමාගම ප්‍රතිප්‍රාග්ධනගත කිරීම මේ අවස්ථාවේ සුදුසු වන්නේයයි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර ඇත. මෙම ආයතනයේ කළමනාකාරිත්වය, කොටස්කරුවන් නියෝජනය වන සුදුසුකම් හා හැකියාවන් සපිරි අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතට පත්විය යුතු බවත් ඒ හේතු කොට ආයතනය සාමාන්‍ය අයුරින් පවත්වා ගැනීමට හැකි වූ විගස දැනට ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි මෙහෙයුම් කටයුතුවල නියැලෙන කළමනාකරණ නියෝජිතයා එම කටයුතුවලින් මුදා හළ යුතු බවත් මුදල් මණ්ඩලය විසින් තවදුරටත් තීරණය කරන ලදී.

මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් නියෝග නිකුත් කර ඇත.

(අ) කොටසක් රුපියල් 40 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 40 ක (40,000,000) නව ප්‍රාග්ධන නිකුතුවක් සඳහා ආයෝජකයන්ට අවස්ථාව සැලසීම - මෙහි දී විශේෂයෙන්ම සමාගමේ කළමනාකාරිත්ව කටයුතු සඳහා ඵලදායී නායකත්වයක් ලබාදීමට හැකියාව ඇති උපාය මාර්ගික ආයෝජකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත.


(ආ) සමාගමේ වර්තමාන තැන්පතු වටිනාකමෙනේ දළ වශයෙන් 10% ක පමණ ප්‍රමාණයක්, කොටසක් රුපියල් 20 බැගින් වූ ඡන්ද බලය රහිත කොටස් මිලියන සියයක් (100,000,000) ලෙස පරිවර්තනය කිරීම තුළින් රුපියල් බිලියන දෙකක (රු.2,000,000,000) තැන්පතු, හිමිකම් ප්‍රාග්ධනය ලෙස පරිවර්තනය කිරීම සඳහා අවස්ථාව සැලසීම - මෙමගින් සමාගමේ තැන්පත්කරුවන්ට ලැයිස්තුගත කරන ලද ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි හිමිකාරිත්වයක් ලබාගැනීමට හැකි වන අතරම ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හට එමගින් තම ජංගම වගකීම් අඩුකර ගැනීම හරහා වඩාත් ස්ථායී මූල්‍ය තත්ත්වයක් කරා ළඟා විය හැක්කේය.

ඒ අනුව, ඉහත පරිදි ප්‍රතිප්‍රාග්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමටත්, 2010 දෙසැම්බර් 15 දින වන විට නව අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපනය කිරීමටත් ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකරණ නියෝජිතයාහට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය නියෝග කර ඇත. එකී නියෝග ප්‍රකාරව ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී විසින් යථා කාලයේ දී ආයෝජකයන් වෙත ඒ සඳහා විධිමත් ලෙස ඇරයුම් කෙරෙනු ඇත.

මූල්‍ය පද්ධතියේ හා සමාගමේ දීර්ඝ කාලීන ස්ථායීතාවය තහවුරු කරනු පිණිස ඉහත සඳහන් පියවරයන් බලගැන්වීම සිදුවන අතර සියලුම ආයෝජකයන් හට සාධාරණත්වයෙන් යුතුව කොටස් නිකුතුව සිදුවනු අරඹයා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොටස් නිකුතුව අධීක්ෂණය කරනු ඇත.

## 10. උද්ධමනය 2010 සැප්තැම්බර් මාසයේ දී ඉහළ යයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 =100) ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන උද්ධමනය, අපේක්ෂා කළ පරිදි 2010 අගෝස්තු මස පැවති සියයට 5.0 හි සිට 2010 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.8 දක්වා ඉහළ ගියේය. 2009 සැප්තැම්බර් මාසයේ පැවති පහළ පදනම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.*




මේ අතර, පසුගිය මාස 12 ක කාලපරිච්ඡේදය තුළ සිදු වූ මිල විචලනයන්හි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, පූර්ව මාසයේ පැවති සියයට 4.5 හි සිට 2010 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.0 දක්වා ඉහළ ගියේය. කෙසේ වුව ද, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර හා බලශක්ති නොවන අයිතමයන්ගේ මිල විචලනය මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 5.5 හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 5.7 දක්වා ඉහළ නැගුණු අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය අනුයාත සිව්වන මාසයටත් සියයට 6.3 හි ස්ථාවරව පැවතිණි.

දර්ශකයෙහි සියයට 1.0 ක් වූ මාසික ඉහළ යෑම සඳහා ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 1.7); රෙදිපිළි හා පාවහන් (සියයට 1.2); සෞඛ්‍ය (සියයට 0.4); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.3); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.2); සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු කටයුතු (සියයට 0.03); යන උප කාණ්ඩවල මිල ඉහළ යෑම් දායක විය. මේ අතර, ප්‍රවාහන, සන්නිවේදන, අධ්‍යාපන හා විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩ මෙම මාසය තුළ දී නොවෙනස්ව පැවතිණි.

## 11. ණය පහසුකම් සඳහා වන සාමාන්‍ය වෙන් කිරීම් අවශ්‍යතාව පහත හෙළීම

*දේශීය හා ගෝලීය ආර්ථික ක්‍රියාකාරිත්වයේ ඇති විය හැකි කිසියම් බිඳවැටීමක් තුළින් බැංකු අංශයටත්, එමගින් මූල්‍ය පද්ධතියටත් එල්ල විය හැකි බලපෑම් අවම කිරීමේ අභිප්‍රායෙන් පූර්වගාමී විචක්ෂණ පියවරක් වශයෙන් බලපත්‍රලාභී බැංකුවල සක්‍රීය ණය සහ විශේෂිත කාණ්ඩයේ ණය මත සියයට 1 ක සාමාන්‍ය ණය අලාභ සඳහා වන වෙන්කිරීම් අනුපාතයක් පවත්වා ගන්නා ලෙස මහ බැංකුව විසින් නියම කරන ලදී.*

2006 නොවැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලද එකී සාමාන්‍ය වෙන්කිරීම මගින් පසුගිය මූල්‍ය සහ ආර්ථික පීඩන සමය තුළ දී අමතර ප්‍රාග්ධන ආධාරකයක් සැපයුණු අතරම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි අපේක්ෂිත ප්‍රතිඵල ද අත් කර දෙන ලදී.

කෙසේ වුවද, වර්තමාන මූල්‍ය පසුබිම ප්‍රවේශමෙන් නිරීක්ෂණය කිරීමේ දී වැටහී යන්නේ දේශීය සහ ගෝලීය ආර්ථික ක්‍රියාකාරිත්වයේ යම් බිඳවැටීමක් ඇති වීමේ අවදානම ශීඝ්‍ර ලෙස පහත වැටී ඇති බවයි. තවද, ප්‍රවර්ධිත සාර්ව ආර්ථික මූලිකාංග මගින් ස්ථායී පසුබිමක් තුළ කඩිනමින් වර්ධනය වීමට දේශීය ආර්ථිකයට මනා ඉඩ හසරක් ද ලැබී තිබේ. තවද, පසුගිය මාස කිහිපය තුළ බැංකු ආයතනයන් ද තම වත්කම්වල ප්‍රමිතිය ඉහළ නංවාගැනීමට සමත් වුණු අතර එම යහපත් තත්ත්වය තව දුරටත් ගුණාත්මක ණය වර්ධනය කිරීමකට හේතු වීම ඔස්සේ සමස්ත ආර්ථිකයේම වර්ධනයට ද හේතු වනු ඇත.

මෙකී පසුබිම තුළ සක්‍රීය ණය සහ විශේෂිත කාණ්ඩයේ ණය පහසුකම් මත පවත්වා ගත යුතු සාමාන්‍ය වෙන්කිරීම් අවශ්‍යතාවය දැනට පවතින සියයට 1 ක් වන අනුපාතයේ සිට 2011 දෙසැම්බර් 31 දින වන විට සියයට 0.5 ක අනුපාතයක් දක්වා පහත හෙළීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලැබ ඇත. මේ අනුව, සියයට 1 ක් වන දැනට පවතින සාමාන්‍ය වෙන්කිරීම් අවශ්‍යතාවය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුවේ සිට කාර්තු පහක් ඇතුළත, කාර්තුවකට සියයට 1 ක අනුපාතයක් බැගින් අඩු කිරීම මගින් සියයට 0.5 ක් දක්වා අඩු කිරීමට බැංකුවලට හැකියාව ලැබෙනු ඇත.

## 12. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම

*2010 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය නීති පනතේ බලතල ප්‍රකාරව අනිවාර්ය තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කරනු ලැබ ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව සතුටින් නිවේදනය කර සිටී. මෙම තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" යනුවෙන් නම් කෙරේ. ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් රුපියල් බිලියන 1.1 කට ආසන්න මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ඇත.*

මෙම තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ලියාපදිංචි මූල්‍ය ආයතන වේ. එකී ආයතනවල ඇති, මෙම රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතනවලට අයත් තැන්පතු, රජයට අයත් තැන්පතු, එම සාමාජික ආයතනවල කොටස් හිමියන්ගේ තැන්පතු, මූලික කළමනාකරුවන් සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන්ට අයත් තැන්පතු, එම ආයතනවලින් සපයනු ලැබ ඇති ණය පහසුකම් වෙනුවෙන් සුරැකුම් වශයෙන් රඳවාගෙන ඇති තැන්පතු සහ බැංකු පනත ප්‍රකාරව අත්හැර දැමූ තැන්පතු වශයෙන් සැළකෙන තැන්පතු මෙන්ම මූල්‍ය නීති පනත ප්‍රකාරව අක්‍රීය ගිණුම්වල තැන්පතු ද හැර අනෙකුත් සියලුම තැන්පතු මෙම ක්‍රමය යටතේ රක්ෂණය කිරීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

මුදල් මණ්ඩලය විසින් යම් සාමාජික ආයතනයක බලපත්‍රය හෝ ලියාපදිංචිය අත්හිටුවීමෙන්/ අහෝසි කිරීමෙන් පසු එකී ආයතනවල එක් එක් තැන්පත්කරුවන් වෙත ශ්‍රී

ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය අනුව රුපියල් ලක්ෂ දෙකක උපරිමයකට යටත්ව හානි පූර්ණ මුදල් ප්‍රදානය කෙරෙනු ඇත. සියලුම සාමාජික ආයතන 2010 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙකී රක්ෂණ ක්‍රමයට දායක වීම අනිවාර්ය වන අතර, එකී ආයතනවල තැන්පත්කරුවන් 2012 ජනවාරි 1 දින සිට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලැබූ මුළු තැන්පතු මත සාමාජික ආයතනවලින් අය කරනු ලබන වාර්ෂික රක්ෂණ වාරිකය සියයට 0.10 සිට සියයට 0.15 දක්වා පරාසයක වනු ඇති අතර, එම වාරික මුදල් මාසික/කාර්තුමය පදනමක් මත ගෙවිය යුතු වනු ඇත. එසේ අය කරනු ලබන දායක මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබන තැන්පතු රක්ෂණ අරමුදලකට බැර කෙරෙනු ඇත. කෙසේ වුවද, එකී තැන්පතු රක්ෂණ අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්වලින් පැහැදිලි වශයෙන්ම වෙන් කොට තබනු ලබන අතර, අරමුදලේ වගකීම් එකතු වී ඇති මුළු අරමුදල්වලට සීමා වනු ඇත.

මූල්‍ය ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය වර්ධනය වීමත් කුඩා පරිමාණ සහ අඩු මූල්‍ය දැනුමක් ඇති තැන්පතුකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමත්, කුඩා පරිමාණ තැන්පත්කරුවන්ගේ ඉතුරුම් වර්ධනය කිරීමත්, නීත්‍යානුකූල නොවන තැන්පතු රැස්කිරීමේ ව්‍යාපාර අඩපණ කිරීමත් එමෙන්ම මූල්‍ය ආයතන කඩා වැටීම තුළින් රජය වෙත ඇති විය හැකි මූල්‍ය වගකීම අඩු කිරීමත් යන අරමුණු මෙකී තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම තුළින් ඉටු වනු ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විශ්වාස කරයි.

## 13. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2008, 2009 සහ 2010

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | 216.9 | 2.8 | -0.1 | 0.2 | 21.6 | 7.6 | 6.9 | 17.0 | 20.3 | 3.1 |
| මාර්තු | 191.9 | 202.0 | 214.8 | 1.7 | -0.4 | -1.0 | 23.8 | 5.3 | 6.3 | 17.7 | 18.6 | 3.2 |
| අප්‍රේල් | 195.4 | 201.0 | 212.6 | 1.8 | -0.5 | -1.0 | 25.0 | 2.9 | 5.8 | 18.7 | 16.7 | 3.4 |
| මැයි | 198.5 | 205.1 | 215.9 | 1.6 | 2.0 | 1.6 | 26.2 | 3.3 | 5.3 | 19.8 | 14.7 | 3.6 |
| ජූනි | 205.9 | 207.8 | 217.7 | 3.7 | 1.3 | 0.8 | 28.2 | 0.9 | 4.8 | 21.0 | 12.5 | 3.9 |
| ජූලි | 206.4 | 208.7 | 217.6 | 0.2 | 0.4 | 0.0 | 26.6 | 1.1 | 4.3 | 21.9 | 10.4 | 4.2 |
| අගෝස්තු | 206.3 | 208.1 | 218.6 | 0.0 | -0.3 | 0.5 | 24.9 | 0.9 | 5.0 | 22.6 | 8.5 | 4.5 |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | 220.7 | 0.4 | 0.2 | 1.0 | 24.3 | 1.1 | 5.8 | 23.2 | 6.6 | 5.0 |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | | -0.3 | 0.4 | | 20.2 | 1.4 | | 23.4 | 5.2 | |
| නොවැම්බර් | 205.2 | 211.0 | | -0.7 | 0.8 | | 16.3 | 2.8 | | 23.0 | 4.1 | |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව